# වී ගොවිතැනේදී භාවිතා කරන ලද පැරණි කෙම්ක්‍රම පිළිබඳ අධ්‍යනයක්

ජී.ඩබ්.සී විදුරංගනී[1] , අයි.පී.ටී.කේ.පී සේනාරත්න[2] , කේ.එම්.සී.එස්ආරියරත්න[3]කේ.එම්.ටී.ආර්,කේ සෙනවිරත්න[4]

[1]පුරාවිද්‍යාව හා ඉතිහාසය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
chathurikavidurangani94@gmail.com,
[2]ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
prasadirusl40@gmail.com,
[3]ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
amcsariyarathna@gmail.com
[4]මූර්ති කලා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා සෞන්දර්යකලා විශ්වවිද්‍යාලය
thusitharuwan060@gmail.com

මුඛ්‍ය පදඃකෙම්ක්‍රම, පාරම්පරික, ගුරුකම්, ස්වයංපෝෂිත, කුල්ල

## හැඳින්වීම

ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හිමිකම් කියන ලද දේශයකි. ආර්යාවගමනයත් සමඟ මෙරට වී ගොවිතැන පිළිබඳ තොරතුරු හෙළිවෙයි. ආර්යයන් මෙරටට පැමිණ තම ජීවනෝපාය මාර්ගය වූ කෘෂිකර්මාන්තය පවත්වා ගැනීමේ පහසුව උදෙසා ගංගාධාර හා ස්වභාවික ජල දහරා ආශ්‍රිත ව තම ජනාවාසයන් පිහිටුවාගෙන ඇත. මෙලෙස ආරම්භ වූ වී ගොවිතැන ආරක්ෂා කිරීමේ අරමුණින් පැරැන්නෝ කෙම් ක්‍රම භාවිත කර ඇත. ''කෙම්'' යන්න තුළින් ආරක්ෂාව යන්න හැඟවේ. වසර 800ත් වඩා පැරණි අතීතයකට හිමිකම් කියන මෙම කෙම්ක්‍රම පිලිබඳව දඹදෙණි යුගයේ රචිත සද්ධර්මරත්නාවලියේ දේවදත්ත වස්තුවේ ''ගොයම් රෝගයට කෙම් කළ යුතුය'' යි සඳහන් වේ. පූජාවලියෙහි ''නොයෙක් රෝගයනට කෙම්පාන් කම්සේ නැතිව කළ මැනැවැ' යි යන්නෙන් සඳහන් වෙයි. මෙලෙස පරැන්නෝ තම කෙත ආරක්ෂාකර ගැනීමට අනුගමනය කළ කෙම්ක්‍රම දේව විශ්වාස හා ආගම් භක්තින් හා බැඳි පාරම්පරික ක්‍රමවේදයකි. කෙම්ක්‍රම ප්‍රධාන වශයෙන් බෙහෙත් භාවිත ක්‍රම, ජෛව විද්‍යාත්මක පලිබෝධ පාලන ක්‍රම වශයෙන් හඳුනාගත හැකි ය. ඒ අනුව කෙම්ක්‍රම පිලිබඳව වැඩිදුර අධ්‍යනය කිරීමත්,ඒවා හඳුන්වාදීමත් මේ තුළින් අධ්‍යනය කිරීමට බලපොරොත්තු වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර හා ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේද භාවිත කර ඇත. ක්ෂේත්‍ර නොවන ගවේෂණයේදී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සද්ධර්මරත්නාවලිය හා පූජාවලියත්, ද්වීතික මූලාශ්‍රය සඳහා පියසේන කහඳගමගේ, විමලකීර්ති හිමි යන කතුවරුන්ගේ ග්‍රන්ථ කිහිපයකුත් පරිශීලනයකර ඇත. ක්ෂේත්‍ර ගවේෂණයේදී වී ගොවිැන් කටයුතුවල නිරතවන, සාම්ප්‍රදායික ගොවිතැන පිළිබඳ දැනුමෙන් පෝෂිත ගොවිමහතුන් සමඟ සාකච්ඡා කිරීම මඟින් ද දත්ත රැස්කර ගන්නා ලදී. ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පරිදි ඡායාරූපකරණය කර ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡා

ගොයමට වැළඳෙන රෝග, ඇස්වහ කටවහ, සතුන් මඟින්වන හානි, කෘමි උවදුරු ආදිය අවම කිරීම හෝ මර්ධනය කිරීම සඳහා අතීතයේ ගොවීහු කෙම්ක්‍රම

විශාල ප්‍රමාණයක් භාවිත කළහ. අලකොළ රෝගය ගැටපණු රෝගය,උරනපතය, කොක්කනාව, කතුරුපණු රෝගය, කරඹුස්නාව, මලකඩ රෝගය, ගොයම් ගෙවීමේ රෝගය, රක්ත රෝගය, කොළ හැකිලීම, කුඹීත්තන් කෑම, කොළපුල්ලි රෝගය, කීඩෑවන් විදීම, පැළ මැක්කන් ගැහීම, කොළ කන දළඹුවා බෝවීම, ගැඩවිලන් කෑම ආදී වශයෙන් හඳුන්වනු ලබන රෝග රාශියක් ගොවියෝ හැඳින සිටි අතර ඒවා මර්ධනයට කෙම්ක්‍රම භාවිත කළහ. ගවමහීෂ, මුව ගෝන, අලි ඇත්, වල් ඌරන්, ඉබ්බන්, හාවන්, පක්ෂීන් ආදීන්ගෙන් ආරක්ෂාකර ගැනීමටත් මිනිසුන්ගේ ඇස්වහ කටවහවලින් සිය කුඹුර ආරක්ෂාකර ගැනීමටත් වැලි මතුරා ඉසිනු ලබයි. පහන් දැල්වීමත්, ඒ සඳහා පොල්තෙල්, කොහොඹ තෙල්, මී තෙල්, තලතෙල් හා එඬරු තෙල් ආදී වූ තෙල් වර්ග යොදාගෙන දින තුනක් පහන් දැල්වීමෙන් මැස්සන් පහනට දැවී අවසන් වෙතැ'යි ගොවීහු විශ්වාස කරති.

ගොක් කොළවලින් වියාගත් පැළලි විශේෂයක් කුඹුරේ එල්ලීම කෙම් පැළලි දැමීම නම් වේ. මෙය කුඹුර වටා අඳිනු ලබන අතර සතුන්ගෙන් ආරක්ෂා වෙයි. ''ගම්මඩු නැටීම'' තුළින් අස්වනු හා ගොවීන්ගේ ආරක්ෂාව බලාපොරොත්තු වෙයි. කෙතට වන සතුන් වදින පාර බලා එම පාරේ ''ගොප්මං ඇදීම'' සිදු කිරීමෙන් වන සතුන්ගෙන් ආරක්ෂාව සැළසේ. කුඹුරට විපත් වනවිට ගොවියා ගීගනරාළට දන්වා ඔහු පවසන දිනයක කුඹුරෙහි මල් පැළක් සාදා යාතිකා කරයි. එහිදී ගීගනරාළ පත්තිනි සළඹ කහ දියෙන් සෝදා සොළවමින් යාතිකාව අරඹයි.

''නමෝ තෙදවරම් පස්වාන් දහසකට සාදු සාදු සිට වැන්දේත්, ඉඳ වැන්දේත්, දස වැන්දේත්, දාස් වැන්දේත්, දොහොත් මුඳුන් තබා වැන්දේත්....බ්‍රහ්ම, විෂ්ණු, මහේෂ්වර, සමන්, කතරගම, විභීෂන, සිද්ධ පත්තිනි දෙවි දේව ස්වමීනි, මෙගම් පැළැස්සට වඩා වැඩුණු ළපටි ගොයමට මැසි මදුරු පණු ගැඩවිලු ආදීන්ගෙන් පැමිණි උවදුරු අළ - පත දිය මෙන් විගත විද්ධමංසනයකොට රැක දෙත්වා'' ආදී වූ යාතිකා මෙහිදී ගායනා කරයි.

ලෝකඩ තැටියක් ගෙන කයිල කෝටුවකින් තැටියට ගසමින් කුඹුරට සෙත් පැතීම ''තැටියෙ ගැසීම'' නම් වේ, ගොයම හොඳින් වැඩී ඵලදායක වනු පිණිස ''මඩදාරන'' නම් දානයක් දෙනු ලැබේ. ගොයමින් නියරවල් වැසී යන වකවානුව මෙම දානය දීමට සුදුසු කාලයයි. ''කතුරුමුරුංගා කෙම'' නමින් තවත් ආකාරයක කෙමකි. ගොයම් පැළ කුඩා අවධියේ කහ පැහැ වී මැරී යාම කතුරු පණුවා කෑම නම් වේ. මෙය වැළැක්වීමට පැරණි ගොවීහු වල් කතුරුමුරුංගා ගසේ මුල් ගෙන වංගෙඩියේ දමා කොටා ලබා ගන්නා යුෂ වතුරට මුසුකර ඉසීම සිදුකර ඇත. එමගින් පණුවන් මර්ධනය කළ හැකි බව පැරැන්නෝ විශ්වාස කළහ. ''නවනිල්ල කෙම'' යනු කොක්නාව නම් පණු රෝගයට සිදු කරන කෙමකි, ''ලණු ඇදීමේ කෙම'' දුම්මල තෙල් පෙගවූ රෙදි කැබලි දිග ලණුවක එල්ලා දෙදෙනෙකු දෙපැත්තෙන් අල්ලාගෙන ගොයමේ ගෑවී යන සේ ඒ මේ අතට ඇදගෙන යනු ලැබේ. ''බොකු ගෑමේ කෙම'' නම් තවත් වර්ගයකි. කුල්ලට ලී මිටක් බැඳ කුල්ල දෙපැත්තේ උණු කළ කොහොල්ලෑ ගා ලී මිටෙන් අල්ලා කුල්ලෙන් ගොයම පිස දමයි. මෙයින් මැස්සෝ මර්ධනය වේ. ''කප්පරවල්ලිය කෙම'' නම් කප්පරවල්ලිය ඖෂධයේ කොළ වංගෙඩියේ ලා කොටා ලබා ගන්නා යුෂ වතුරට මිශ්‍රකොට කෙතට ඉසීම මගින් ගොයම් මැස්සන් වඳවී යන බව ගොවීහු විශ්වාස කළහ. නොයිඳුල් වරකා ගෙඩියක් කැලි අටක් කහ ජීවම්කර හැන්දෑවක කුඹුරේ අට කොනේ තබයි. එය ඉබ්බන් මර්ධනයට යොදා ගත කෙම් ක්‍රමයකි. මෙහිදී පසුදා

වනවිට ඉබ්බන් වරකා කැලි අසල රැඳී සිටියි.

අතීත ගොවීහු තම කෙත උවදුරුවලින් ආරක්ෂාකර ගැනීමට මෙම කෙම්ක්‍රම භාවිතකර ඇත. මේවා ආගමික භක්තිය හා විශ්වාස සමඟ සම්බන්ධ කරන්නට ඇත්තේ ගොවිතැන සඳහා අලුත් පරම්පරාවල කැමැත්ත දිනා ගැනීමටත් ආකර්ෂණීය බවක් ඇති කිරීම සඳහාත් විය හැක. මෙම ක්‍රමවේද රහසක් බවට පත් කිරීම තුළින් එක් පිරිසකට එම ගුරුකම් පිලිබඳ අධ්‍යනයේ උවමනාව ඇති කරන්නට ඇත. කෙම්ක්‍රම පිලිබඳ දන්නා තැනැත්තා සමාජයේ ගෞරවනීය පුද්ගලයෙකු බවට පත් වන්නට ඇත්තේ ද ඒ නිසා විය හැකිය. කෙම්ක්‍රම රහසක් සේ සැළකුනේ ද ඒවා රැක ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කිරිමට යැයි සිතීම සාධාරණ ය.

අධ්‍යනයේදී හෙළි වූ විශේෂ කරුණක් නම් මෙම සියලු ක්‍රමයක් පාහේ පරිසර හිතකාමී විමයි. කෘමි නාශක වල් නාශක පිලිබඳ නොදත් ගොවියා තම කෙත ආරක්ෂාකර ගත්තේ මෙම කෙම්ක්‍රම තුලිනි. මේවායෙහි විද්‍යාත්මක පදනමක් ද දක්නට ලැබෙයි.

නමුත් වර්තමානය වනවිට මෙම කෙම්ක්‍රම කෙතෙන් දුරස් වී ඇත. කෘත්‍රිම කෘමි නාශක, වල් නාශක, භාවිතය, කෙම් ක්‍රම පිලිබඳ නොදත්කම, පසෙහි රසායනික සංයුතියෙහි වෙනස්වීම්, සාම්ප්‍රදායික කෙම්ක්‍රම පිලිබඳ විශ්වාසයක් නොපැවතීම ආදී හේ ගෙන කෙම්ක්‍රම වර්තමානයේ කෙතෙන් ඉවත් වෙමින් පවතී. නමුත් නැවත වතාවක් මෙම ක්‍රමවේදය භාවිත කරන්නේ නම් මිනිසුන්ට පමණක් නොව සතාසිවුපාවාට ද හිතකර ස්වයංපෝෂිත කෙතක් බිහිකරගත හැකිවනු නොඅනුමානය.

## ආශ්‍රිත ග්‍රන්ථ


කහඳගමගේ,පියසේන. (1997)***කෙතක මහිම.*** චතුර මුද්‍රණ ශිල්පියෝ.

විමලකිර්ති හිමි, මැදඋයන්ගොඩ. (ශ්‍රී.බු.ව.2495)***සිංහල ගොවිතැන.***පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.


## සම්මුඛ සාකච්ඡා


රණසිංහ, කොණ්ඩසිංහ. මූලාචාරියලාගේ, 2018.02.05.කුරටියාව,කලංකුට්ටිය,(අවු:60),ගොවිතැන, අනුරාධපුර දිස්ත්‍රික්කය, අකුරු හැකියාව ඇත.

ආරියරත්න, කොණ්ඩසිංහ. මූලාචාරියලාගේ, 2018.02.05.මීදෙල්ලෑව,සියඹලෑව,(අවු:54),ගොවිතැන,අනුරාධපුර දිස්ත්‍රික්කය, අකුරු හැකියාව ඇත.

ආබරණඅප්පු, කොණ්ඩසිංහ. මූලාචාරියලාගේ, 2018.02.05 මිදෙල්ලෑවව,සියඹලෑව. (අවු:80),ගොවිතැන,අනුරාධපුර දිස්ත්‍රික්කය,අකුරු හැකියාව ඇත.